


**පහත සඳහන් තනතුර සඳහා මෙහි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ❖ බංගලා සහායක (පිරිමි) III වන ශ්‍රේණිය තනතුර (කොන්ත්‍රාත් පදනම)

| | | | |
|---|---|---|---|
| **1.** | **රැකියාවේ ස්වභාවය** | : | සමාගම සතු නිල නිවාසයක, නිවාඩු නිකේතනයක හෝ බංගලාවක දිවා/රාත්‍රී සේවා මුර ක්‍රමයට සේවය කල යුතුය. අමුත්තන්ගේ අවශ්‍යයතාවය පරිදි ආහාර වර්ග පිළියෙල කිරීම සහ පිළිගැන්වීමද ජලනළ, විදුලි, පින්තාරු කටයුතු සම්බන්ධ මූලික නඩත්තු කටයුතු සිදුකිරීම සහ තමන් අනුයුක්ත ප්‍රදේශය පිරිසිදුව පවත්වාගෙන යාමද සිදු කිරීම. |
| **2.** | **රැකියාවේ වගකීම්** | : | ▪ ගෘහ පාලන කටයුතු, ආහාර පිසීම, පිළිගැන්වීම සහ ඊට අදාළ දෑ පිරිසිදුව පවත්වාගෙන යාම සහ සත්කාරක සේවා කටයුතු සිදු කිරීම.<br>▪ තමන් අනුයුක්තව සිටින ප්‍රදේශය පිරිසිදුව පවත්වාගෙන යාම, නඩත්තු කිරීම සහ නඩත්තු කටයුතු සඳහා පැමිණෙන කාර්යය මණ්ඩලයට සහාය වීම.<br>▪ තමන් අනුයුක්තව සිටින ස්ථානයට අදාල සියළුම අයිතමයන් නිසි ලෙස පවත්වාගෙන යාම සහ ඒවා වෙනුවෙන් වගකිව යුතු වේ. |
| **3.** | **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** | : | ▪ අවම වශයෙන් එකොළොස් (11) වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබා තිබිය යුතුය.<br>▪ ගෘහ පාලනය පිළිබඳ දැනුමක් සහ කුසලතාවයක් තිබිය යුතුය.<br>▪ ආහාර පාන වර්ග පිළියෙල කිරීම සහ පිළිගැන්වීම සඳහා නිපුණතාවයක් තිබිය යුතු අතර සත්කාරක සේවය පිළිබඳ කුසලතා තිබිය යුතුය.<br>▪ ජලනල වැඩ, විදුලි වැඩ, පින්තාරු වැඩ සහ ගෙවතු වගාව පිළිබඳ මූලික කුසලතා සහ බංගලාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෙනත් කුසලතා තිබිය යුතුය. |
| **4.** | **සේවා පළපුරුද්ද** | : | පිළිගත් ආයතනයක නිවාඩු නිකේතනයක හෝ හෝටලයක අදාළ ක්ෂේත්‍රයෙන් අවම වශයෙන් වසර දෙකක (02) සේවා පළපුරුද්දක් තිබිය යුතුය. |
| **5.** | **වයස** | : | අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 35ට අඩුවිය යුතුය. |
| **6.** | **තෝරා ගැනීමේ ක්‍රමය** | : | ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි |

<u>**පොදු කරුණු**</u>

**වැටුප - තෝරා ගනු ලබන්නන් හට ආකර්ශනීය මාසික දීමනාවක් හිමිවේ.**

ඉහත තනතුර සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම නිල නිවාසයක, නිවාඩු නිකේතනයක හෝ බංගලාවක අවශ්‍යතාවය අනුව සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් කරුණාකර අපගේ www.airport.lk>CORPORATE>CAREERS වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට **2021 මැයි මස 25** වන දිනට පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුවේ.

**අධ්‍යාපන, පාඨමාලා සහතික ,සේවා පළපුරුදු සහතිකවල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

**Source: www.airport.lk (2021.05.12)**